# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2291/30 – 2022 අගෝස්තු මස 03 වැනි බදාදා – 2022.08.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බීඩි සෑදීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1)(අ) වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ 2015 මැයි 27 වැනි දින අංක 1916/13 දරන අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාරව කම්කරු කොමසාරිස් බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති වන මම බීඩි සෑදීමේ කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යා කොට ඇති උපලේඛනයේ දැක්වෙන කැලි ගණන්වලට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයන් එම ආඥාපනතේ 33(2) වන වගන්තිය අනුව තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලබයි.

යෝජිත තීරණයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා පිළිබඳව දැක්වෙන 2022 අගෝස්තු මස 19 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා ම විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලක් විය යුතු අතර, එම විරෝධතාවයන් දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයන් ද ඊට අඩංගු විය යුතුය.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
සභාපති,
බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2022 ජූලි මස 27 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

1A – G 37169 – 09 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1957ක් වූ නොවැම්බර් මස 29 වැනි දින අංක 11208 දරන අති විශෙෂ *ගැසට් පත්‍ර* නිවේදනයෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින්කල වෙනස් කරන ලද්දා වූ ද අන්තිම වරට 2019 සැප්තැම්බර් 01 වැනි දින අංක 2138/3 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයෙහි* පළකරන ලද දැන්වීම්වලින් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

***II** වැනි කොටස*

**කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයන්**

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ සූදානම් කිරීම, ඔතන කොළ කැපීම, ඔතන කොළ තැබීම, කැපූ එතුම් කොළ ''බීඩි දුම්කොළ'' වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි බැඳීම ඇතුළුව) බීඩි එතීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් -

| | | |
|---|---|---|
| (අ) | දිග අඟල් 2ට නොවැඩි බීඩි 1000ක් සඳහා | - රු. 500.00 |
| (ආ) | දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1000ක් සඳහා | - රු. 562.00 |
| (ඇ) | දිග අඟල් 3ට නොඅඩු බීඩි 1000ක් සඳහා | - රු. 612.00 |

(කැපූ එතුම් කොළ ''බීඩි දුම්කොළ'' වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි බැඳීම ද ඇතුළුව එහෙත් බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ පිළියෙල කිරීම සහ ඔතන කොළ කැපීම හැර) බීඩි එතීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් -

| | | |
|---|---|---|
| (අ) | දිග අඟල් 2ට නොවැඩි බීඩි 1000ක් සඳහා | - රු. 375.00 |
| (ආ) | දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1000ක් සඳහා | - රු. 425.00 |
| (ඇ) | දිග අඟල් 3ට නොඅඩු බීඩි 1000ක් සඳහා | - රු. 468.00 |

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ පිළියෙල කිරීම ද ඇතුළුව) ඔතන කොළ කැපීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් -

| | | |
|---|---|---|
| (අ) | දිග අඟල් 2ට නොවැඩි බීඩි 1000ක් | - රු. 250.00 |
| (ආ) | දිග අඟල් 2ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1000ක් සඳහා | - රු. 275.00 |
| (ඇ) | දිග අඟල් 3ට නොඅඩු බීඩි 1000ක් සඳහා | - රු. 287.00 |

එතූ බීඩි වටා ලේබල් සවි කිරීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණය බීඩි 1000ට රු. 62.50ක් විය යුතුය.

EOG 8 - 0032

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.